**බිංගිරිය ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 25 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 24 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට බිංගිරිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉඩම් 09 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | සමීක්ෂණ මණ්ඩලයක් පත්කර මෙම ඉඩම්වල වටිනාකම් තක්සේරු කර 2020 වර්ෂයේ අවසන් ගිණුම් තුළින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ආ) | සභාවට පරිත්‍යාග ලෙස ලැබී තිබුණු ජල නල හා උපකරණ 958 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | දක්වා ඇති උපකරණ පිළිබඳව සොයා බලා වටිනාකම තක්සේරු කිරීමටත් 2020 වර්ෂයේ අවසන් ගිණුමට ඇතුළත් කිරීමටත් කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය ආරම්භක දිනට පැවති රු. 2,541,472 ක් වූ අවිනිශ්චිත බැර ශේෂයට හේතු හෙළිදරව් කර ගැනීම හා වැරදි නිවැරදි කිරීම් සිදුකර නොතිබුණි. | අවිනිශ්චිත ගිණුම් ශේෂයට හේතු හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂයට හේතු හෙළිදරව් කරමින් පවතින අතර ඉදිරියේදී වැරදි නිවැරදි කිරීමට පියවර ගන්නා බව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ටෙන්ඩර් කුලී හිඟය රු.768,642 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | සිදුවී ඇති දෝෂය පිළිගන්නා අතර 2020 වර්ෂයේ අවසන් ගිණුම තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඉ) | මෝටර් රථ හා කරත්ත රු.5,076,000 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | සිදුවී ඇති දෝෂය පිළිගන්නා අතර 2020 වර්ෂයේ අවසන් ගිණුම තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඊ) | දේශීය ණය හා සංවර්ධන අරමුදලට ස්ථාවර නියෝග අනුව ගෙවූ රු.145,309 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 දෙසැම්බර් මස දේශීය ණය හා සංවර්ධන අරමුදල් ණය වාරිකය වන 145,309 ක මුදල ණය හිමි කර ගිණුම්ගත කර ඇත. |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 04 කට අදාළව රු.63,286,672 ක නොසැසඳීම් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | අදාළ උපලේඛන පරීක්ෂාකර බලා අදාළ යාවත්කාලීන කිරීම් සිදු කර මෙම වෙනස අවම කර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඌ) | වටිනාකම රු. 312,188,596ක් වූ ගිණුම් විෂයයන් 11 කට අදාළව විස්තරාත්මක උපලේඛන හා ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | සිදුවී ඇති අඩුපාඩුව පිළිබඳව කණගාටු වන අතර ඉදිරි විගණන කටයුතු සඳහා අදාළ ලිපි ලේඛන හා තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (එ) | සමාලෝචිත වර්ෂය තුළදී සභාවට පරිත්‍යාග ලෙස ඉඩම් වෙන්දේසිවලින් ලැබී තිබුණු ඉඩම් 04 ක වටිනාකම් ගිණුම්වල හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම්වල පිරිවැය ගිණුම්ගත කළ යුතුවේ. | මෙම අඩුපාඩුව 2020 වර්ෂයට අදාළ අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 1.4 අනුකූල නොවීම්

------------------

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

----------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| | (i) රීති 60 | ව්‍යාපාර බදු පිළිබඳ සමීක්ෂණය කරනු ලබන නිලධාරියා විසින් ව්‍යාපාර බදු පිළිබඳ ලැයිස්තුවේ ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාශය, වරිපනම් අංකය හා වාර්ෂික වටිනාකම සඳහන් කර නොතිබුණි. | අදාළ ලැයිස්තුවේ මූලික තොරතුරු සඳහන් කළ යුතුවේ. | විගණනය විසින් පෙන්වා දී ඇති අඩුපාඩුව නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි |
| | (ii) රීති 218 | සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | රීති ප්‍රකාරව සමීක්ෂණ කටයුතු සිදුකර ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ සිට සභාව සතු සියළු ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණ මණ්ඩලයක් මගින් පරීක්ෂා කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ආ) | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 | | | |
| | 6.2.2 උප වගන්තිය | ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ අවම කාලසීමාව දින 21 ක් වුවද, 2019 වර්ෂයට වත්කම් බදුදීමට අදාළ ලංසු ඉදිරිපත් කිරීම සඳහා දින 15 ක් පමණක් ලබා දී තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේදී ලංසු කැඳවීමේ අවම කාලසීමාව 2019 සැප්තැම්බර් 10 දින සිට 2019 ඔක්තෝම්බර් 09 දින දක්වා ලබා දී ඇත. ඒ අනුව එම අඩුපාඩුව මේ වන විට නිවැරදි කර ගෙන ඇති බව දන්වා සිටිමි. |

**02.** **මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 18,894,646 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 29,137,196 ක් විය.

**2.2** **මූල්‍ය පාලනය**

----------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වර්ෂ ගණනාවක සිට පැවත එන රු. 53,717 ක් වූ අහරු චෙක්පත් පිළිබඳව මුදල් රෙගුලාසි 189 හා 486 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙම චෙක්පත සම්බන්ධයෙන් තොරතුරු සොයාගැනීමේ අපහසුතාවයක් ඇත. තවදුරටත් සොයා බලා කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ආ) | 2019 දෙසැම්බර් බැංකු සැසඳුම් ප්‍රකාශනයේ හඳුනා නොගත් වෙනස රු. 181,846 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | හඳුනා නොගත් වෙනස්කම් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම හඳුනානොගත් වෙනස පෙර වර්ෂවල සිටම පැවත එන අතර ඊට අදාළ තොරතුරු සොයා ගැනීමේ අපහසුවක් ඇත. මෙම හේතුව නිසාවෙන් මෙම වෙනස නිරවුල් කිරීමට නොහැකි වී ඇත. |
| (ඇ) | ගෙවීම් මුදල් පොත පවත්වා ගැනීම, චෙක් ලිවීම හා නිකුත් කිරීම, ගෙවීම් වවුචර් පවත්වා ගැනීම, වැය ශීර්ෂ තුලනය වැනි ප්‍රධාන මූල්‍ය ක්‍රියාකාරකම් 11 ක් එක් නිලධාරියෙකුට පවරා තිබුණි. | එක් ගනුදෙනුවක් නිලධාරීන් කිහිප දෙනෙකුගෙන් පරීක්ෂා වන ආකාරයට රාජකාරි පැවරීමට කටයුතු කළ යුතුවේ. | පවතින සේවක සංඛ්‍යාව පදනම්ව රාජකාරී පැවරීම මත මෙම අඩුපාඩුව සිදු වී ඇත. මේ වන විට කළමනාකරණ සහකාර 01 පුරප්පාඩුවක් ද පවතී. ඉදිරියේදී රාජකාරී පැවරීම සම්බන්ධ සංශෝධනයක් සිදු කර පෙන්වා දී ඇති අඩුපාඩුව නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 2.3 ආදායම් පරිපාලනය

------------------------

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | 2019 වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තු ගතආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගතආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| I. | වරිපනම් හා බදු | 2,864,307 | 4,352,704 | 4,091,970 | 182,764 | 2,879,307 | 3,621,293 | 3,752,289 | 78,938 |
| II. | බදු කුලී | 14,702,060 | 16,028,377 | 16,028,377 | 764,557 | 14,702,060 | 13,618,791 | 13,819,122 | 768,007 |
| III. | බලපත්‍ර ගාස්තු | 910,036 | 1,201,008 | 1,201,008 | - | 910,000 | 814,005 | 815,005 | - |
| IV. | වෙනත් ආදායම් | 99,398,660 | 83,302,085 | 83,302,085 | 67,369,368 | 70,616,700 | 89,695,292 | 76,819,273 | 44,712,708 |
| එකතුව | | 117,875,063 | 104,884,174 | 104,623,440 | 68,316,689 | 89,108,067 | 107,749,381 | 95,205,689 | 45,559,653 |

**සටහන**

**-----------**

**2018 හා 2019 රැස්කළ ආදායම් අගය තුළ පසුගිය වර්ෂවලට අදාළ හිඟ ලැබීම්ද ඇතුළත්ව තිබුණි.**

### 2.3.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපල 35 කින් රු.81,376 ක වරිපනම් බදු මුදලක් අයවිය යුතුව පැවතුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ වන විට අනෙකුත් හිඟ ශේෂයන් අය කර ගනිමින් පවතින බව දන්වා සිටිමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට ඉඩම් හිමියන් 131 කගෙන් රු.36,587 ක අක්කර බදු මුදලක් අයවිය යුතුව පැවතුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අක්කර බදු ලේඛණය අක්‍රමවත් ලෙස පවත්වාගෙන ගොස් තිබූ නිසා ලේඛනය නිවැරදි කර 2020 වර්ෂයේ මෙම මුදල් අයකරගෙන යමින් පවතී. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු. 64,800 ව්‍යාපාර බදු මුදලක් අයවිය යුතුව තිබුණි. | ව්‍යාපාර බදු නියමිත කාල වකවානු තුළ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම හිඟ ශේෂයන් සඳහා නඩු පවරා ඇත. මේ වන විට නඩු 13 ක් සඳහා තීන්දු ලැබී ඇත. අනෙකුත් නඩු සඳහා ඉදිරි නඩු දින යෙදී ඇති බව දන්වා සිටිමි. |

### 2.3.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | | |
|---|---|---|---|---|
| | | අදාළ වර්ෂය | හිඟ මුදල රු. | අයකර ගැනීමට ගත් පියවර |
| වාර්ෂික ටෙන්ඩර් දේපල බදුදීම්වලට අදාළව සමාලෝචිත වර්ෂයට පෙර සිට පැවත එන අවස්ථා 05 කට අදාළව රු.764,557 ක බදු කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2012 | 241,037.91 | නඩු තීන්දුව ලැබී ඇත. බදුකරු බන්ධනාගාර ගතවී සිටින නිසා අයකර ගැනීමට නොහැකි වී ඇත. |
| | | 2012 | 37,557.68 | පුද්ගලයා මිය ගොස් ඇති බැවින් හිඟ මුදල කපාහැරීමට පළාත් පාලන කොමසාරිස්තුමාට යොමු කිරීමෙන් පසුව මේ වන විට ඒ පිළිබඳ විමර්ශන කටයුතු සිදුකෙරෙමින් පවතී |

| | | |
|---|---|---|
| 2013 | 228,600.00 | නඩු තීන්දුව ලැබී ඇත. බදුකරු මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදකට බන්ධනාගාර ගතවී සිටින නිසා අය කර ගැනීමට නොහැකි වී ඇත. |
| 2016 | 176,472.20 | නඩු පවරා ඇත |
| 2016 | 80,889.20 | නඩු පවරා ඇත |

**2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ඇස්තමේන්තුගත උසාවි දඩ රු.8,235,964 ක් හා මුද්දර ගාස්තු රු.30,279,147 ක් විය. | හිඟ මුදල් ලබාගෙන කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කළ යුතුවේ. | මෙම උසාවි දඩ හා මුද්දර ගාස්තු අයවෙමින් පවතින බව දන්වා සිටිමි. |

**03. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 29 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ බැවින් එම කාරණා සම්බන්ධයෙන් වයඹ පළාත් සභාව පනවා තිබුණු අතුරු ව්‍යවස්ථා සභාව විසින් වැළඳගෙන තිබුණි. | සභාවේ අවශ්‍යතාවය පරිදි පනතේ විධිවිධාන ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළයුතු අතර වැළඳගත් අතුරු ව්‍යවස්ථා අනුව කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි. |

(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2018 වර්ෂයේ රු. 9,400,000 ක් වැයකර ඉදිකර තිබුණු කඩකාමර 8 කින් සමන්විත බෝවත්ත බස් නැවතුම්පල අදාළ අරමුණු සඳහා යොදාගෙන නොතිබුණි. | මහජනතාවට එම වත්කම්වල ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කළ යුතුවේ. | මෙම වසරේදී අවශ්‍ය ප්‍රතිපාදන සපයාගෙන එම ප්‍රතිපාදන යොදවා බස්නැවතුම්පල ක්‍රියාකාරී තත්ත්වයට ළඟාකර ජනතා අයිතියට පත්කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. |
| (ii) | 2017 හා 2018 වර්ෂවල පළාත් නිශ්චිත මාර්ග, ප්‍රවාහන සංවර්ධන හා වෙළඳ නිවාස ඉදිකිරීම් කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන මත කහවලවත්ත පානීය ජල ව්‍යාපෘතිය සඳහා රු.7,189,225 ක් වැයකර වසර තුනක් ගතවී තිබුණද, ජනතාවට ජලය ලබාදීමට කටයුතු කර නොතිබුණි. | මහජනතාවට එම වත්කම්වල ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කළ යුතුවේ. | 2018 වර්ෂයේ අවසානය තෙක් අදාළ ව්‍යාපෘතියේ කාර්යයන් අවසන් කර ගැනීමට බාධා ඇතිවූ අතර විශේෂයෙන් (විදුලිය ලබාගැනීම, ඉදිකර ඇති ළිඳ සඳහා ආවරණයක් ඉදිකිරීම) 2020 වර්ෂයේදී ප්‍රතිපාදන යොදවා ක්‍රියාකාරී තත්ත්වයකට පත්කිරීමට බලාපොරොත්තු වෙමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව සභාව දැනුවත් වී තිබුණු අතර තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණි. තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් වැඩසටහන් 11 ක් ක්‍රියාත්මක කර තිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු කෙරෙහි අවධානය යොමුකර අයවැය පිළියෙල කර ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමට අදාළ ඉල්ලුම් පත්‍ර නිර්දේශ ලබා ගැනීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වෙත යවා තිබූ නමුත් 2020 පෙබරවාරි 28 වන විටත් අනුමත කර එවා නොමැති ව්‍යාපාර ඒකක 497 කින් 2019 වර්ෂය තුළ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | පවතින ගැටළුව පිළිබඳව අදාළ බලධාරීන් සමඟ සාකච්ඡා කර නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් විමසා ඇත. ඉදිරි ක්‍රියාමාර්ග පිළිබවඳව මෙතෙක් දැනුවත් කර නොමැත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂය තුළ ඇතුළත් වර්ෂයක් හා ඊට වැඩි කාලයක් ඉක්මවා ඇති එකතුව රු.17,096,279 ක් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ ශේෂයන් සම්බන්ධයෙන් සොයා බලා අයකර ගත හැකි ශේෂ අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂය තුළ වර්ෂයක් හා ඊට වැඩි කාලයක් ඉක්මවා ඇති එකතුව රු.3,314,087 ක් වූ ශේෂ ගෙවා නිදහස් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් ලෙස රු.2,424,763 ක් වසර ගණනාවක් ගෙවා නොමැතිව තිබී ඇති අතර මෙම ශේෂය පිළිබඳව තවදුරටත් සොයා බලා ඉදිරියේදී ගෙවීමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.12,747,034 ක් වූ තැන්පතුවලින් ආපසු ගෙවිය හැකි තැන්පතු හඳුනාගෙන ගෙවීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වර්ෂය අවසානයට රු.12,747,034 ක් වූ තැන්පතුවලින් ඉදිරියේදී ආපසු ගෙවිය යුතු තැන්පත් හඳුනාගෙන ගෙවීමට හෝ ආදායමට ගැනීමට තවදුරටත් සොයාබලා කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

### (අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත තනතුරුවල පුරප්පාඩු 34 ක් හා අතිරික්ත 19 ක් පැවතුණි. | අවශ්‍යතා විශ්ලේෂණය කර අත්‍යාවශ්‍ය තනතුරුවලට අදාළ පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි. |

### (ආ) සේවක ඇප

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට නිලධාරීන් 40 කගෙන් රු. 106,575 ක ඇප මුදල් අයකර ගෙන තිබුණු අතර 2011 දෙසැම්බර් 15 දිනැති අංක ච/ප්‍ර/ලේ/5/4/1/8 දරන ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව නිලධාරීන්ගේ නමින් ගිණුම් ආරම්භ කර එම ඇප මුදල් තැන්පත් කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර වර්ෂ අවසානයේ ගිණුම් ශේෂ කර නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | අදාළ නිලධාරීන්ගේ නමින් ඇප මුදල් තැන්පත් කිරීම සඳහා ගිණුම් ආරම්භ කිරීමට අයදුම්පත් පුරවා බැංකුව වෙත භාරදී ඇත. මේ සම්බන්ධ අනෙකුත් කටයුතු කඩිනමින් සිදු කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වරිපනම් හිඟ මුදලින් කාර්තු 03 කට වඩා හිඟ දේපල 14 කින් රු.64,058 ක මුදලක් අයවීමට පැවති අතර හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ඒ අනුව ලේඛන යාවත්කාලීන කළ යුතුවේ. | මෙම හිඟ දේපල රාජ්‍ය ආයතන වන අතර අදාළ ආයතන ලිඛිතව දැනුවත් කර ඇත. |

**3.5 වත්කම් කළමනාකරණය**

-----------------------------

**3.5.1 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

--------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ රු.3,100,000 ක් වැයකර ග්‍රීන් එස්ටේට් ඉඩමේ ඉදිකර තිබුණු ප්‍රජා ශාලාව හා වැසිකිළි පද්ධතිය නිශ්කාර්යව පැවතුණි. | මහජන මුදල් ආර්ථිකව, කාර්යක්ෂමව හා ඵලදායී ලෙස වැය කිරීමට කටයුතු කළ යුතුවේ. | ජන ශුන්‍ය ප්‍රදේශයක ඉදිකර ඇති මෙම ඉදිකිරීම සඳහා ජලය සපයා ගැනීමේ ගැටළුවක් ද ඇති වී තිබේ. ඉදිරියේදී මෙම ස්ථානය උත්සව ශාලාවක් ලෙස වැඩිදියුණුකර මෙම වැසිකිළි පද්ධතිය විවෘත කිරීමට කටයුතු කරමි. |

**3.6 ප්‍රසම්පාදනය**

-------------

**3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම**

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ප්‍රකාරව 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. | අදාළ මාර්ගෝපදේශ මගපෙන්වීම් අනුව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2020 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කර ඇත. |

**3.6.2 සැපයීම් හා සේවා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ පුස්තකාල 03 ක් හා කාර්යාල කටයුතු සඳහා රු.422,000 ක් වූ ලැප්ටොප් පරිගණක 05 ක් මිලදී ගැනීමේදී පිරිවිතරවලට නොගැළපෙන මිලදී ගැනීම් සිදුකර තිබූ අතර තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශද ලැබී නොතිබුණි. | මිලදීගත් භාණ්ඩ සඳහා ගෙවීම් කිරීමට පෙර පිරිවිතරවලට අනුකූල ද යන්න පරීක්ෂා කළ යුතුවේ. | මෙම ගැටළුව සම්බන්ධයෙන් අදාළ ආයතනය දැනුවත් කිරීම සිදු කළ අතර ඊට පිළිතුරු වශයෙන් මේ සම්බන්ධයෙන් අප වෙත ලිපියක් ඉදිරිපත් කර ඇත. අදාළ ලිපිය අනුව විගණනය විසින් පෙන්වා දී තිබූ කරුණු සම්බන්ධයෙන් තාක්ෂණික සාධාරනීකරණයක් සිදු කර ඇත. |